සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## බුද්ධ ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. "මහණෙනි ඔබට දැන් මවක නැත. පියකු නැත. එහෙයින් මෙබඳු අවස්ථාවක දී එකිනෙකා ඔවුනොවුන්ට උපකාරීව සහයෝගයෙන් ක්‍රියා කළ යුතු ය." බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළේ,
   (1) පූතිගත්ත තිස්ස තෙරුන් මුල් කරගෙන ය.
   (2) මහා කාශ්‍යප තෙරුන් මුල් කරගෙන ය.
   (3) උදරාබාධිතව පෙළුණු භික්ෂුවක් මුල් කරගෙන ය.
   (4) මුගලන් මහරහතන් වහන්සේ මුල් කරගෙන ය.

2. බුදුරජාණන් වහන්සේට ද ධර්මයට ද සංඝරත්නයට ද අගුණ කියමින් හා ගුණ කියමින් පැමිණි පරිබ්‍රාජකයා හා අන්තේවාසිකයා පිළිවෙළින් කවරහු ද?
   (1) බ්‍රහ්මදත්ත හා සුප්‍රබුද්ධ
   (2) සුප්පිය හා බ්‍රහ්මදත්ත
   (3) සුප්පිය හා ඉසිදත්ත
   (4) සුප්පිය හා සෝණදණ්ඩ

3. බුදුරජාණන් වහන්සේ දහවන වස් කාලය ගත කළේ,
   (1) බරණැස ඉසිපතන මිගදායේ ය.
   (2) විශාලා මහනුවර කූටාගාර ශාලාවේ ය.
   (3) පාරිලෙය්‍ය වනයෙහි ය.
   (4) සැවැත්නුවර වේළුවනාරාමයෙහි ය.

4. උස් හඬින් කතා කළහොත් බුදුරජාණන් වහන්සේ තම අසපුවට වැඩම නොකරාවි යැයි කියා තම සිසුන් නිශ්ශබ්ද කරනු ලැබුයේ,
   (1) සෝණදණ්ඩ බමුණා විසින් ය.
   (2) පොට්ඨපාද පිරිවැජියා විසින් ය.
   (3) උපක ආජීවකයා විසින් ය.
   (4) සංජය පිරිවැජියා විසින් ය.

5. බුදුරජාණන් වහන්සේ විසින් රෝග වැළඳීමට හේතු අටක් දේශනා කළේ කිනම් භික්ෂූන් වහන්සේ අරභයා ද?
   (1) ගිරිමානන්ද හිමි
   (2) ආනන්ද හිමි
   (3) මහා කාශ්‍යප හිමි
   (4) මහා මුගලන් හිමි

6. "සත්හට වන බව දුකට වෙදාණන්" යන ලෝවැඩ සඟරා කවි පදයට අනුව බුදුරජාණන් වහන්සේ,
   (1) සත්ත්වයාගේ කායික ලෙඩ දුක්වලට උතුම් වෛද්‍යවරයකු වන සේක.
   (2) සසර දුකට ප්‍රතිකාර කරන උතුම් වෛද්‍යවරයකු වන සේක.
   (3) උසස් ශල්‍ය වෛද්‍යවරයකු වන සේක.
   (4) සත්ත්වයාට වන ඕනෑම ලෙඩ දුක්වලට ප්‍රතිකාර කළ උතුම් වෛද්‍යවරයකු වන සේක.

7. සැරියුත් මහ රහතන් වහන්සේ බුදු සසුනෙහි පැවිදි වීමට පෙර පැවිදිව සිටියේ,
   (1) උපතිස්ස පිරිවැජියා සමීපයේ ය.
   (2) කෝලිත පිරිවැජියා සමීපයේ ය.
   (3) උපක ආජීවකයා සමීපයේ ය.
   (4) සංජය පිරිවැජියා සමීපයේ ය.

8. බෝසතාණන් වහන්සේ දාන පරමත්ථ පාරමිතාව පූරණය කළ බව හෙළිවන ජාතක කථාව,
   (1) සස ජාතකයයි.
   (2) සිවි ජාතකයයි.
   (3) වෙස්සන්තර ජාතකයයි.
   (4) මඛාදේව ජාතකයයි.

[දෙවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

9. තමා විසින්ම පිළිපැද ඇස්පනාපිට මෙලොව දී ම ප්‍රතිඵල දැක ගතහැකි බැවින් ධර්මය,
(1) ඕපනයිකයි. (2) සන්දිට්ඨිකයි. (3) අකාලිකයි. (4) ඒහිපස්සිකයි.

10. ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කර ගන්නා පැහැදීම,
(1) අමූලිකා ශ්‍රද්ධාව නම් වේ. (2) තුන්තරා බෝධිය නම් වේ.
(3) අවෙච්චප්පසාදය නම් වේ. (4) භක්තිය නම් වේ.

11. තෙරුවන ගුණ කීය ද?
(1) නවයකි. (2) දහසයකි. (3) විස්සකි. (4) විසිහතරකි.

12. සිතෙහි කයෙහි නිදිමත ගතිය, උදාසීනකම පවතී නම් පාඩම් කළ දෙය මතකයට නොඑයි. ඒ නිදිමත බව හා උදාසීනකම හැඳින්වෙන්නේ,
(1) ථීනමිද්ධ නමිනි. (2) විචිකිච්ඡාව නමිනි.
(3) කාමච්ඡන්දය නමිනි. (4) ව්‍යාපාදය නමිනි.

13. සමථ භාවනාවෙන් ලැබෙන ප්‍රතිඵලයක් **නොවන්නේ**,
(1) මතක ශක්තිය දියුණු වීමයි.
(2) පිළිවෙළින් යමක් ඉදිරිපත් කිරීමට හැකි වීමයි.
(3) ත්‍රිලක්ෂණයට අනුව ලෝකය දෙස බැලීමයි.
(4) වහා අවබෝධ කරගැනීමේ ශක්තිය දියුණු වීමයි.

14. දුශ්ශීල ව නොසන්සුන් සිත් ඇතිව අවුරුදු සීයක් ජීවත් වීමට වඩා සිල්වත්ව සන්සුන් සිත් ඇතිව එක දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨ ය" මෙම අදහස ඇතුළත් ධම්ම පද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) "අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනෙ ධනං" යන්නයි.
(2) "යොචේ වස්සසතං ජීවේ - දුස්සීලෝ අසමාහිතෝ" යන්නයි.
(3) "සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ" යන්නයි.
(4) "සුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියේසු අසංවුතං" යන්නයි.

15. ප්‍රතිසන්ධිය ලබා දීමට ඉවහල් වන කර්මය වන්නේ,
(1) ජනක කර්මයයි. (2) උපත්ථම්භක කර්මයයි.
(3) උපපීඩක කර්මයයි. (4) උපඝාතක කර්මයයි.

16. දුගී පවුලක උපත ලැබුව ද ඉහළ මට්ටමේ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදාවිය හැක්කේ,
(1) උපධි සම්පත්තියෙනි. (2) කාල සම්පත්තියෙනි.
(3) ප්‍රයෝග සම්පත්තියෙනි. (4) ජාති සම්පත්තියෙනි.

17. පුද්ගලයාගේ චින්තනය හා විමංසනය පිළිබඳ අයිතියත්, නිදහසත් අගය කරමින් බුදුරජාණන් වහන්සේ කේස පුත්ත නියම් ගම්වාසීන්ට දේශනා කළ සූත්‍රය,
(1) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි. (2) කාලාම සූත්‍රයයි.
(3) වීමංසක සූත්‍රයයි. (4) මංගල සූත්‍රයයි.

18. චූල්ලකම්ම විභංග සූත්‍රයේ දැක්වෙන පරිදි අන් සැපතට ඊර්ෂ්‍යා කිරීමෙන් ලැබෙන ප්‍රතිඵලය වන්නේ,
(1) අඩු වයසින් මිය යාමයි. (2) පහත් යැයි සම්මත කුලවල ඉපදීමයි.
(3) අල්පේශාක්‍යව ඉපදීමයි. (4) දුර්වර්ණව ඉපදීමයි.

19. "නැවත සසරට එකතු නොවීම නිසා උපතක් සිදු නොවේ" යන්න සඳහන් වන පටිලෝම පටිච්ච සමුප්පාද ඉගැන්වීම වන්නේ,
(1) භව නිරෝධා ජාති නිරෝධෝ යන්නයි.
(2) උපාදාන නිරෝධා භව නිරෝධෝ යන්නයි.
(3) තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ යන්නයි.
(4) වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ යන්නයි.

20. පඤ්ච ස්කන්ධය යනු,
(1) රූප, වේදනා, තණ්හා උපාදාන, විඤ්ඤාණ ය.
(2) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ ය.
(3) රූප, වේදනා, තණ්හා, උපාදාන, භව ය.
(4) රූප, වේදනා, සඤ්ඤා, විඤ්ඤාණ, නාමරූප ය.

[තුන්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

21. 'විභව තණ්හාව' යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) පරලොවක් නැත යැයි විශ්වාස කිරීමයි.
(2) මොලොව-පරලොව දෙකම පිළිගැනීමයි.
(3) දිගින් දිගටම සසර සැපත විඳීමට ඇති ආශාවයි.
(4) මොලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාවයි.

22. අකුසලය ද අකුසල මූලය ද, කුසලය ද කුසල මූලය ද, අකුසලය ද අකුසල විපාකය ද කුසල ද කුසල විපාක ද දැන දැක ගන්නා ඥානය අරි අටඟි මඟෙහි,
(1) සම්මා කම්මන්ත නම් වේ. (2) සම්මා ආජීව නම් වේ.
(3) සම්මා වායාම නම් වේ. (4) සම්මා දිට්ඨි නම් වේ.

23. ත්‍රි ශික්ෂාවේ සීල ශික්ෂාවට අයත් **නොවන** මාර්ගාංගය වන්නේ කුමක් ද?
(1) සම්මා වායාම (2) සම්මා වාචා
(3) සම්මා කම්මන්ත (4) සම්මා ආජීව

24. සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස, ශෝකය, වැලපීම්වලින් තොර වීම හා දුක්ඛ දෝමනස්සයන්ගෙන් මිදීම පිණිස මෙන්ම නිවන් අවබෝධය පිණිස එකම මග ලෙස බුදුදහමේ හැඳින්වෙන්නේ,
(1) සතර ඍද්ධි පාද ය. (2) සතර කමටහන් ය.
(3) සතර සංග්‍රහ වස්තු ය. (4) සතර සතිපට්ඨාන ය.

25. රාජ්‍ය පාලකයකුට තම ජනතාවගේ දියුණුව හා සතුට දැක අවංකවම ඒ ගැන සිතුටු වීමේ හැකියාව,
(1) කරුණාව නම් වේ. (2) උපේක්ඛාව නම් වේ.
(3) මුදිතාව නම් වේ. (4) මෙත්තාව නම් වේ.

26. අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීම,
(1) අර්ථචර්යාවයි. (2) සමානාත්මතාවයයි.
(3) යහපාලනයයි. (4) පරාර්ථකාමී බවයි.

27. පාලකයකු පසිඳුරන් පිනවීමට දවසේ වැඩි කාලයක් ගත නොකොට පාලිතයන් හා රට වෙනුවෙන් කළ යුතු යුතුකම් දසරාජ ධර්මවල හැඳින්වෙන්නේ,
(1) මෘදු බව ලෙසිනි. (2) තපස ලෙසිනි.
(3) ඉවසීම ලෙසිනි. (4) සීලය ලෙසිනි.

28. රටවැසියන් වශයෙන් ගෙවිය යුතු බදු මුදල් බුදු දහමේ හඳුන්වන්නේ,
(1) රාජ බලි නමිනි. (2) අතිථි බලි නමිනි.
(3) දේවතා බලි නමිනි. (4) පුබ්බපේත බලි නමිනි.

29. ධාර්මිකව උපයා සපයා ගත් ධනයක් ඇතැයි සිතා යමෙක් සතුටක් ලබන්නේ නම් එය,
(1) අත්ථි සුඛය නම් වේ. (2) භෝග සුඛය නම් වේ.
(3) අනණ සුඛය නම් වේ. (4) අනවජ්ජ සුඛය නම් වේ.

30. භික්ෂූන් වහන්සේලාට උගන්වා ඇති පරිදි උන් වහන්සේලා දත් වැළඳිය යුතු වන්නේ,
(1) මද වඩනු පිණිස ය. (2) ශරීරය සරසා ගනු පිණිස ය.
(3) කඩවසම් වනු පිණිස ය. (4) පිළිවෙත් පිරීමට උපකාරයක් වනු පිණිස ය.

31. බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන පරිදි නැගිට ගැනීමටවත් බැරිතරමට කෑම ගෙන එහිම පෙරළී සිටින්නා,
(1) කාකමාසක නම් වේ. (2) භුත්ත වමිතක නම් වේ.
(3) තත්ථාවට්ටක නම් වේ. (4) ආහර හත්ථක නම් වේ.

32. දෙවන ධර්ම සංගායනාව සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළේ,
(1) සබ්බකාමී මහ රහතන් වහන්සේ ය. (2) උපාලි මහ රහතන් වහන්සේ ය.
(3) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය. (4) මහාදේව තෙරුන් වහන්සේ ය.

33. ඒ ඒ ධර්ම කොටස් මුඛ පරම්පරාවෙන් රැකගෙන ඉදිරියට ගෙන ඒම සඳහා භාණක පරම්පරාවලට භාර දුනි. ඒ අනුව මජ්ඣිම නිකාය භාර දෙනු ලැබුයේ,
(1) සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පාරාවට ය.
(2) මහා කාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පාරාවට ය.
(3) ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පාරාවට ය.
(4) අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පාරාවට ය.

[හතරවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK EXAMMOOD.LK

254270

**34.** මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ විසින් සම්පාදනය කොට අභිධර්ම පිටකයට එක් කරනු ලැබුයේ,
(1) පට්ඨානප්පකරණයයි. (2) යමකප්පකරණයයි.
(3) විභංගප්පකරණයයි. (4) කථාවත්ථුප්පකරණයයි.

**35.** මහින්දාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය හැකි කරුණක් **නොවන්නේ**,
(1) දේශීය භික්ෂු සමාජය ආරම්භ වීම ය.
(2) මහා විහාරය කේන්ද්‍ර කර ගත් අධ්‍යාපනයක් ඇරඹීම ය.
(3) රාජ්‍ය පාලනය භික්ෂූන් යටතට ගැනීම ය.
(4) කැටයම් හා මූර්ති කලාවක් බිහි වීම ය.

**36.** "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය" මේ සටන් පාඨය පෙරදැරි කරගෙන කටයුතු කළ පාලකයා කවු ද?
(1) වළගම්බා මහ රජතුමා (2) ධාතුසේන මහ රජතුමා
(3) මහ පැරකුම්බා මහ රජතුමා (4) දුටුගැමුණු මහ රජතුමා

**37.** පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලියැවුණේ,
(1) පොළොන්නරු යුගයේ දී ය. (2) දඹදෙණි යුගයේ දී ය.
(3) කුරුණෑගල යුගයේ දී ය. (4) අනුරාධපුර යුගයේ දී ය.

**38.** අනාබද්ධ බුද්ධ ප්‍රතිමාවකට නිදසුනක් වන්නේ,
(1) අවුකන බුද්ධ ප්‍රතිමාවයි. (2) මාළිගාවිල බුද්ධ ප්‍රතිමාවයි.
(3) තොළුවිල බුද්ධ ප්‍රතිමාවයි. (4) සැස්සේරුව බුද්ධ ප්‍රතිමාවයි.

**39.** ආමලකාකාර දාගැබක ගර්භයේ ස්වරූපය අනුව එය,
(1) නෙළුමක හැඩය ගනී. (2) නෙල්ලි ගෙඩියක හැඩය ගනී.
(3) කළයක හැඩය ගනී. (4) සීනුවක හැඩය ගනී.

**40.** "සම්බුදු සසුන බේරා ගැනීමට තවත් විසිපස් වතාවක් මේ දඹදිව ඉපදේවා" යන ප්‍රාර්ථනය කළේ කවු ද?
(1) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ය.
(2) රේරුකානේ චන්ද්‍රවිමල මහ නාහිමි ය.
(3) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ය.
(4) ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා ය.

* *

EXAMMOOD.LK EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

11 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

## බුද්ධ ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) "මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති" ආදි වශයෙන් නිබ්බුත පද පවසනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ii) "ඉමස්මිං සති ඉදං හොති, ඉමස්මිං අසති ඉදං න හොති" මෙම පාඨයේ අදහස ලියන්න.

(iii) සතර අගති නම් කරන්න.

(iv) "දානංච ධම්මචරියා ච - ඤාතකානඤ්ච සංගහෝ" යන මෙම ගාථාවේ දැක්වෙන මඟුල් කරුණු **දෙකක්** ලියන්න.

(v) බුදු දහමේ උගන්වන 'අණන සුඛය' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(vi) බුදු දහමේ දැක්වෙන සිරිත් හා විරිත් යන්නෙහි අදහස පැහැදිලි කරන්න.

(vii) බුදුරජාණන් වහන්සේ වජ්ජී රජදරුවන්ට හඳුන්වා දුන් රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය කුමක් ද?

(viii) බුද්ධ ප්‍රතිමා ප්‍රධාන වශයෙන් වර්ග තුනකට බෙදා දක්වනු ලැබේ. ඉන් **දෙකක්** ලියන්න.

(ix) පොළොන්නරු සාහිත්‍ය යුගයේ දී බුදුරජාණන් වහන්සේගේ පුරිස දම්ම සාරථී ගුණය පාදක කොට රචනා කළ ගද්‍ය කෘතිය හා එහි කතුවරයා නම් කරන්න.

(x) එංගලන්තයේ පාලි පොත් සමාගම (Pali Text Society) ආරම්භ කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

**2.** (i) සිඟාලෝවාද සූත්‍රයේ දී නැගෙනහිර හා දකුණු දිසාවන්ට උපමා කරනු ලැබුවෝ කවරහු ද?

(ii) ඉහත (i) හි දැක්වූ එක් සමාජ කණ්ඩායමකින් ඔබට ඉටු විය යුතු යුතුකම් **තුනක්** දක්වන්න.

(iii) "අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටු කිරීමෙන් සමස්ත සමාජයේම දියුණුව සිදු වේ." මෙය සාකච්ඡා කරන්න.

**3.** (i) පුද්ගලයාගේ කීර්තිය (යසස) වැඩීමට ඉවහල් වන කරුණු අවධාරණය කරමින් දේශනා කළ ධම්මපද ගාථාව ලියන්න.

(ii) ඉහත (i)හි සඳහන් ගාථාවේ අදහස ලියන්න.

(iii) "ධම්ම පදය සමස්ත මානව වර්ගයාටම පරිහරණය කළ හැකි වටිනා උපදෙස් ඇතුළත් ග්‍රන්ථයක් ලෙස සැලකිය හැකි ය." විමසන්න.

**4.** (i) "විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද හතරක් වේ. ඉන් **දෙකක්** දක්වන්න.

(ii) "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි" මේ පාඨය ඇසුරෙන් කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පහදන්න.

(iii) කුසලාකුසල කර්ම පිළිබඳ අවබෝධය මෙලොව පරලොව ජීවිත සාර්ථක කර ගැනීමට ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න.

**5.** (i) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන පුද්ගලයාගේ මෙලොව හිතසුව පිණිස පවතින කරුණු **දෙකක්** දක්වන්න.

(ii) ඉහත (i) හි දැක්වූ කරුණුවලින් එක් කරුණක් පැහැදිලි කරන්න.

(iii) එකී කරුණු ලෞකික ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා හේතු වන අයුරු පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

6. (i) තෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට ඉවහල් වූ කරුණු සැකෙවින් පහදන්න.

(ii) එම සංගායනාව පැවැත්වූ ස්ථානය, රාජානුග්‍රහය ලබාදුන් පාලකයා හා මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ නම් කරන්න.

(iii) "බුදු දහමේ දේශාන්තර ව්‍යාප්තිය සිදු වූයේ තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ය." පැහැදිලි කරන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** පමණක් කෙටි සටහන් ලියන්න.

(i) වැලිවිට සරණංකර මාහිමි

(ii) සතර සංග්‍රහ වස්තු

(iii) මාතලේ අලුවිහාර සංගායනාව

(iv) සඳකඩපහණ

* * *

EXAMMOOD.LK
EXAMMOOD.LK